සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය** **ඉතිහාසය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි ඃ
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3) සහ (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. ගම්පොළ රාජ්‍ය සමයේ සිට කෝට්ටේ රාජ්‍ය සමය තෙක් මෙරට දේශපාලන තොරතුරු හැදෑරීමේ දී වඩාත් උචිත මූලාශ්‍රය, මෙම මූලාශ්‍ර අතරින් කුමක් ද?
(1) චූලවංසය (2) දීපවංසය (3) රාජාවලිය (4) නිකාය සංග්‍රහය

02. අතීතයේ භික්ෂූන් වහන්සේලාට ලෙන් පූජා කිරීම වාර්තා කිරීම සඳහා ලියන ලද සෙල්ලිපි හඳුන්වන්නේ කුමන නමින් ද?
(1) ආසන ලිපි (2) පුවරු ලිපි (3) ටැම්ලිපි (4) බ්‍රාහ්මීය ලෙන් ලිපි

03. මීට වසර 28000 ට පෙර ප්‍රාග් ඓතිහාසික මානවයන්ගේ වාසස්ථානයක් ව පැවති බවට සාක්ෂි හමුවන ස්ථානයක් වන්නේ මින් කුමක් ද?
(1) පාහියන්ගල (2) කුරුවිට බටදොඹ ලෙන
(3) කිතුල්ගල බෙලි ලෙන (4) මානියම්ගම

04. ශ්‍රී ලංකාවේ ගල් යුගයට අයත් සාක්ෂි හමුවන ස්ථාන අතර ප්‍රථමයෙන්ම කියවෙන ස්ථානයක් වන්නේ,
(1) රත්නපුරය (2) මාගම (3) ගාල්ල (4) මාතොට

05. පූර්ව රාජ්‍ය සමයේ ගමිකයන් තෝරා ගැනීම ගෘහපතියන් අතරින් සිදු වූ බව සඳහන් වන සාහිත්‍ය මූලාශ්‍රය කුමක් ද?
(1) ජාතකට්ඨකතාව (2) මහාවංසය (3) සමන්ත පාසාදිකාව (4) චූලවංසය

06. දේශපාලන බලය මධ්‍යගත කිරීමේ ක්‍රියාවලියේ දී විශාල කාර්යභාර්යක් කළ පාලකයන් කිහිප දෙනෙකු හා ඔවුන්ගේ කාර්යන් A, B, C හා D ලෙස දක්වා ඇත. ඒවා ගැළපෙන පරිදි යා කළ විට ලැබෙන පිළිතුර කුමක් ද?

| A | B |
|---|---|
| 1. පණ්ඩුකාභය රජතුමා | A ශ්‍රී මහා බෝධි රෝපණ උත්සවයට කතරගම හා චන්දනගාම ක්ෂත්‍රියන්ට ආරාධනා කිරීම |
| 2. දේවානම් පියතිස්ස රජතුමා | B පරිපාලන දිස්ත්‍රික්ක බෙදා ඒ ඒ දිස්ත්‍රික්ක පාලනයට ඇමතිවරු පත්කිරීම |
| 3. දුටුගැමුණු රජතුමා | C තමන්ගේ දසවන රාජවර්ෂයේ දී ග්‍රාමසීමා ලකුණු කිරීම |
| 4. වසභ රජතුමා | D පරුමුකවරුන්ට විවිධ තනතුරු දීම |

(1) CADB (2) ACBD (3) BCAD (4) CBDA

- පහත සඳහන් වන්නේ ශ්‍රී ලංකාවේ පැරණි පාලනය හා සම්බන්ධ ආයතන කීපයකි. ඒවා උදව්කරගෙන පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A එක්තැන්සමිය B සභාව C මහලේ D දසගම් ඇත්තන්

07. රාජ සභාව හා අධිකරණ කටයුතු සිදු කළ ආයතන දෙක නියෝජනය කළ අක්ෂර අයත් පිළිතුර තෝරන්න.
(1) A හා C (2) B හා D (3) A හා B (4) C හා D



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

08. ශ්‍රී ලංකාවේ අතීත රජවරු අසල්වාසී රටවල් සමග සුහදශීලී සම්බන්ධතා පැවැත් වූ ආකාරය දක්වන සිදුවීම් කිහිපයක් පහත වගුවේ දක්වා ඇත. ඒවා නිවැරදිව ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| රජතුමා | සම්බන්ධතාවය |
|---|---|
| 1. පළමු ගජබා රජතුමා | A පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට චෝර රාජ්‍යයට යාම |
| 2. භාතිකාභය රජතුමා | B චීනයට රාජ්‍ය තාන්ත්‍රික දූත ගමන් 20 ක් පැවැත්වීම |
| 3. හයවන අග්බෝ රජතුමා | C කාලිංග දේශය සමග විවාහ සම්බන්ධතා පැවැත්වීම |
| 4. පළමු විජයබා රජතුමා | D රෝමානුක දේශයට තානාපතින් යැවීම |

(1) ADBC (2) ABDC (3) ACBD (4) BACD

09. යම්කිසි වස්තුවක් පොළවට ලම්භාකාර වීමෙන් එම වස්තුව මගින් පොළව මත ඇතිකරන පීඩනය නිෂ්ක්‍රීය වන්නේ ය. යන භෞතික විද්‍යා මූලධර්මය භාවිතා කළේ පහත සඳහන් කුමන නිර්මාණ කිරීමේ දී ද?

(1) මැටි බඳුන් සෑදීමේ දී (2) සොරොව්ව ඉදිකිරීමේ දී
(3) ස්තූප ඉදිකිරීමේ දී (4) නිවාස හා සොහොන් ගර්භවල බිත්ති බැඳීමේ දී

10. A කරීසය B පරමාණුව C ගුන්ජා D වස

ඉහත මිම් අතරින් දිග හා බර මැනීම සම්බන්ධයෙන් භාවිතා වූ මිනුම් සම්බන්ධ නිවැරදි පිළිතුර තෝරන්න.

(1) A සහ C ය. (2) A සහ B ය. (3) B සහ C ය. (4) C සහ D ය.

11. පහත 'අ' තිරුවේ සඳහන් රජවරු හා 'ආ' තීරුවේ සඳහන් නීති නිවැරදිව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුරු තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. අමණ්ඩ ගාමිණී රජු | A කැලෑවල ගස් කොලන් නොකැපිය යුතු බව |
| 2. හතරවන මිහිඳු රජු | B ජලාශවල ජීවත්වන පක්ෂීන් නොමැරිය යුතු බව |
| 3. නිශ්ශංකමල්ල රජු | C කිසිදු සතෙකු නොමැරිය යුතු බව |
| 4. තුන්වන උදය රජු | D මී හරක්, එළුවන්, එළහරකුන් මැරීමට මරණ දඬුවම පැනවීම |

(1) CBAD (2) CDBA (3) ACBD (4) CABD

12. නිසි කාලයට සී සෑම නොකරන පුද්ගලයින්ට කළං පහක දඩයක් නියම කිරීම සම්බන්ධ නීතියක් පනවා ඇති සෙල්ලිපිය කුමක් ද?

(1) සොරබොරවැව ටැම් ලිපිය (2) සිතුල්පව්ව ලිපිය
(3) කොණ්ඩවට්ටවාන් ලිපිය (4) වේවැල් කැටිය ලිපිය

- **පහත ප්‍රකාශ අධ්‍යයනය කර 13, 14 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A බෙලිගල දළදා මැඳුරක් කරවා දළදා වහන්සේ එහි තැන්පත් කිරීම.
B කාලිංග මාඝගෙන් රට බේරා ගැනීම.
C දඹදෙණිය විජයසුන්දරාරාමය කරවීම.
D චන්ද්‍රභානු නම් ජාවක රජු පරාජය කිරීම.
E ජෝතිය සිටාණන්ගේ කැරැල්ල මර්දනය කිරීම.
F සිංහල සංගය නම් කැරැල්ල ඇතිවීම.
G වන්නි ප්‍රදේශ කෝට්ටේ රාජ්‍යයට ඈදා ගැනීම.

13. ඉහත ප්‍රකාශ අතරින් III විජයබාහු රජුගේ කාලයට අයත් සිදුවීම් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) D හා F (2) C හා E (3) A හා C (4) B හා D

14. ඉහත ප්‍රකාශ අතරින් VI වන පරාක්‍රමබාහු රජුගේ කාලයට අයත් සිදුවීම් මොනවාදැයි තෝරන්න.

(1) A හා B (2) B හා C (3) E හා F (4) E හා G

15. පහත ප්‍රකාශ සැලකිල්ලට ගෙන එම ප්‍රකාශවලට අදාළ රජතුමා කවුදැයි තෝරන්න.

A ගන්නෝරුව සටනට නායකත්වය දී පෘතුගීසීන් පරාජය කිරීම.
B පෘතුගීසීන්ගෙන් මෙරට බේරාගැනීමට 1638 ලන්දේසි සමග ගිවිසුම් ඇතිකර ගැනීම.

(1) I විමලධර්ම සූරිය රජතුමා (2) II වන රාජසිංහ රජතුමා
(3) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (4) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා

16. මහනුවර යුගයේ දී අධිකාරම් වරුන්ගේ ආඥා හෝ පණිවිඩ ප්‍රාදේශීය නිලධාරින් කරා ගෙන ගිය නිලධාරින් කවුරුන් ද?

(1) විදානේ (2) මුහන්දිරම් (3) කටුපුල්ලේ (4) උණ්ඩියරාල

17. පුනරුද අවධියේ විලාසිතාවක් බවට පත් වූයේ කුමන භාෂා ඉගෙනීම ද?

(1) ග්‍රීක හා ලතින් (2) ප්‍රංශ හා ඉංග්‍රිසි (3) ජපන් හා ජර්මන් (4) ප්‍රංශ හා ලතින්

18. පුනරුද සමයේ නව චිත්‍ර කලාවක් බිහිකළ මධ්‍යස්ථානයක් ලෙස වැදගත් වූ නගරය කුමක් ද?

(1) වැනීසිය (2) ජිනෝවා (3) ෆ්ලෝරන්ස් (4) රෝමය

- **පහත දැක්වෙන A හා B ප්‍රකාශ ඇසුරින් 19, 20 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A විජයබාකොල්ලය

B කුසුමාසන දේවිය උඩරට රැජිණ කරවීම

19. කෝට්ටේ රාජධානිය කොටස් තුනකට බෙදීයාම සම්බන්ධයෙන්

(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.

(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

20. පෙරෝ ලොපෙස් ද සූසාගේ උඩරට ආක්‍රමණය සම්බන්ධයෙන්

(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.

(3) A සත්‍යවන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

21. කාර්මික විප්ලවය මුලින්ම ඇතිවූ රට කුමක් ද?

(1) ප්‍රංශය (2) පෘතුගාලය (3) බ්‍රිතාන්‍යය (4) ස්පාඤ්ඤය

- **කාර්මික විප්ලවය නිසා කළ සොයාගැනීම් හා ඒවා සොයාගත් පුද්ගලයන් පහත දක්වා ඇත. ඒවා උදව්කරගෙන 22, 23 ප්‍රශ්නවල පිළිතුර තෝරන්න.**

| කාර්මික ක්ෂේත්‍රය | සොයාගැනීම | සොයාගැනීම් කළ පුද්ගලයා |
|---|---|---|
| A පේෂ කර්මාන්තය | D ආරක්ෂක ලාම්පුව | I විලියම් සීමන්ස් |
| B යකඩ කර්මාන්තය | E දුවන නඩාව | J හම්ප්‍රි ඩේවි |
| C ගල් අඟුරු කර්මාන්තය | F විදුලි උදුන | K ජෝන් කේ |

22. පේෂ කර්මාන්තය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) BEK (2) AEK (3) CFK (4) AEI

23. යකඩ කර්මාන්තය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) BFJ (2) BDI (3) BFJ (4) BFI

24. 17 වන සියවසේ මුල් දශක දෙක තුළ අග්නිදිග ආසියාවේ වෙළඳ බලය ගොඩනගා ගැනීමට ගැටුම් ඇතිකරගත් කණ්ඩායම් දෙක ඇතුලත් පිළිතුර තෝරන්න.

(1) පෘතුගීසීන් හා ලන්දේසීන් (2) පෘතුගීසීන් හා ප්‍රංශ ජාතිකයින්

(3) ලන්දේසීන් හා ඉංග්‍රීසින් (4) ඉංග්‍රීසින් හා ප්‍රංශ ජාතිකයින්

25. ක්‍රි.ව. 1796 - 98 අවධියේ දී ඉංග්‍රීසින් විසින් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවලදී අයකළ බදු වලින් ජනතාවට වඩාත් පීඩාකාරී බදු වර්ගය වූ බදු වර්ගය කුමක් ද?

(1) වෙළඳසැල් බද්ද (2) ඇඟ බද්ද (3) පොල්ගස් බද්ද (4) බලු බද්ද

26. 1815 උඩරට ආක්‍රමණය සාර්ථක කර ගැනීම සඳහා උපායශීලීව සැලසුම් කළ ඉංග්‍රීසි නිලධාරියා වූයේ කවුරුන් ද?

(1) මැක්ඩෝවල් (2) ජෝන් ඩොයිලි (3) ෆෙඩ්රික් නෝර්ත් (4) තෝමස් මෙට්ලන්ඩ්

27. ''මාසික තැග්ග'' නම් ප්‍රකාශනය නිකුත් කරන ලද මිෂනාරි සමාගම කුමක් ද?

(1) ඇමරිකන් මිෂනාරි සමාගම (2) බැප්ටිස් මිෂනාරි සමාගම

(3) චර්ච් මිෂනාරි සමාගම (4) වෙස්ලියන් මිෂනාරි සමාගම

28. කොටහේනේ දීපදුත්තාරාමයෙහි වැඩ වාසය කරමින් බෞද්ධ පුනරුද ව්‍යාපාරයට දායකත්වය ලබාදුන් ස්වාමින් වහන්සේ කවුරුන් ද?

(1) වස්කඩුවේ සුභූති හිමි. (2) පොතුවිල ඉන්ද්‍රජෝති හිමි.

(3) හික්කඩුවේ සුමංගල හිමි. (4) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි.

29. අනුරාධපුරයේ පූජනීය ස්ථාන රැකගැනීමේ ව්‍යාපාරයට හා ඉන්දියාවේ බුද්ධගයාව වැනි පූජනීය ස්ථාන රැකගැනීමේ ව්‍යාපාරයට දායකත්වය සැපයූ පුද්ගල යුගලය අඩංගු පිළිතුර තෝරන්න.

(1) වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා හා අනගාරික ධර්මපාල තුමා

(2) අනගාරික ධර්මපාල තුමා හා එස්. මහින්ද හිමි

(3) වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා හා ඕල්කට් තුමා

(4) ඕල්කට් තුමා හා අනගාරික ධර්මපාල තුමා

- **පහත සඳහන් වන්නේ 1833 - 1947 දක්වා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල ලක්ෂණ කිහිපයක් වේ. ඒවා උපයෝගී කරගෙන 30, 31, 32 ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

A ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම.
B සීමිත ඡන්ද බලය ලැබීම.
C පළාත්බද ඡන්ද නියෝජන ක්‍රමය ලැබීම.
D බලය හා වගකීම වෙන වෙනම පැවරීම.
E සර්වජන ඡන්ද බලය ලැබීම.
F ද්විමාණ්ඩලික පාර්ලිමේන්තුව පිහිටුවීම.

30. කොල්බෲක් හා කෲව් මැකලම්
(1) A හා C (2) A හා B (3) B හා C (4) A හා D

31. C, D ප්‍රකාශවලට අදාළ ප්‍රතිසංස්කරණ 2 තෝරා ලියන්න.
(1) 1920 මැනිං හා 1924 මැනිංඩෙවොන්ෂර් (2) 1931 ඩොනමෝර් හා 1910 කෲව් මැකලම්
(3) 1931 ඩොනමෝර් හා 1947 සෝල්බරි (4) 1833 කෝල්බෲක් හා 1910 කෲව් මැකලම්

32. ඩොනමෝර් හා සෝල්බරි ප්‍රතිසංස්කරණ වලට අදාළ ලක්ෂණ පෙන්වන පිළිතුර තෝරන්න.
(1) A හා B (2) B හා C (3) C හා E (4) E හා F

33. කෝපිවලට අයකළ අපනයන බද්ද අඩුකළ ආණ්ඩුකාරවරයා වූයේ කවුද?
(1) පෙඩ්රික්නෝත් (2) ටොරින්ටන් (3) එඩ්වඩ් බාන්ස් (4) හියුක්ලිපර්ඩ්

34. වතු වගාව කරා මුදල් ආයෝජනය කරවීමට අවශ්‍ය මුදල් පහසුකම් සාධාරණ පොලියකට ලබාගැනීමට ඉතිරි කිරීමේ බැංකුවක් පිහිටුවීමට මුලින්ම යෝජනා කළේ,
(1) කෝල්බෲක් (2) කෲව්මැකලම් (3) ඩොනමෝර් (4) මැනිං ප්‍රතිසංස්කරණ

- **පහත සඳහන් වගු සටහන් උදව් කරගෙන 35, 36 ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

| පිහිට වූ දේශපාලන පක්ෂය | මුල් වූ අය | පිහිටවීමට අරමුණු |
|---|---|---|
| A ලංකා සමසමාජ පක්‍ෂය | D ඒ. ඊ. ගුණසිංහ | G දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් සුරැකීම |
| B කම්කරු පක්‍ෂය | E ජී. ජී. පොන්නම්බලම් | H සමාජවාදී සමාජය නිර්මාණය කිරීම |
| C ද්‍රවිඩ සංගමය | F එන්. ඇම්. පෙරේරා | I කම්කරු අයිතිවාසිකම් දිනාගැනීම |

35. ලංකා සමසමාජ පක්ෂය පිළිබඳව නිවැරදි ප්‍රකාශය ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) AEH (2) AFH (3) BFH (4) CFH

36. කම්කරු පක්ෂය පිහිටවීම පිළිබඳ නිවැරදි ප්‍රකාශය ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ADI (2) CDI (3) BDI (4) BDG

- **පහත A B C D වල දක්වා ඇති ප්‍රකාශ පද යුගල අධ්‍යයනය කොට 37, 38, 39 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A 1. බොස්ටන් තේ සාදය
  2. ඇමෙරිකන් විප්ලවය
B 1. වර්සෙල්ස් ගිවිසුම
  2. ජර්මනියේ පරාජිකත්වය
C 1. සාර් පාලනය
  2. ප්‍රංශ විප්ලවය
D 1. විශ්වය පිළිබඳ සාධක
  2. විද්‍යාවේ දියුණුව

37. පළමුවැන්න දෙවැන්න වැතිවීමට හේතු වූ ආකාරය පෙන්වන යුගලය අයත් පිළිතුර තෝරන්න.
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

38. පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවයක් නැති යුගලය තෝරන්න.
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

39. ලෝකයේ කිසිදු බල කඳවුරකට ගැති නොවී නොබැඳි පිළිවෙත් අනුගමනය කරමින් නොබැඳි ජාතීන්ගේ සමුළුව පිහිටුවීමට පුරෝගාමී වූ තැනැත්තා මින් කවුරුන් ද?
(1) වින්සන්ට් චර්චිල් (2) මාර්ෂල් ටිටෝ
(3) ජවහර්ලාල් නේරු තුමා (4) ඊජිප්තු ජනාධිපති අබ්දුල් ගමාල් නසාර්

40. පහත සඳහන් කාර්යයන් හා සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ආයතනය කුමක් ද?
* ජාත්‍යන්තර සාමයට හා ආරක්ෂාවට තර්ජනය විය හැකි ගැටුම් පරීක්ෂා කිරීම
* ඒවා සාමකාමීව විසඳීම
* කිසියම් ආක්‍රමණයකට විරුද්ධව ආර්ථික සම්බාධක පැනවීම
* එවැනි අවස්ථාවක යුධ බලය යෙදවීම

(1) ජාත්‍යන්තර අධිකරණය (2) ආරක්ෂක මණ්ඩලය
(3) මහලේකම් කාර්යාලය (4) ආර්ථික හා සමාජ මණ්ඩලය

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය** **ඉතිහාසය - II** **කාලය පැය 03 යි.**

නම/ විභාග අංකයඃ

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **II** කොටසින් ප්‍රශ්න 3 ක් ද, **III** කොටසින් ප්‍රශ්න දෙකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I - කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමේ ද ලකුණු කොට නම් කරන්න.

(i) කිරිදි ඔය, යාන්ඔය, හුරුළු වැව, මිනිපේ අමුණ, සල්වතොට, දඹකොළ පටුන, යාපහුව, අලිමංකඩ, ඉබ්බන්කටුව, කල්පිටිය, ගන්නොරුව, කාලතිත්ථ (ලකුණු 12)

(ii) ගෝව, කළු මුහුද, පෘතුගාලය, කොරියාව, මලක්කා සමුද්‍රසන්ධිය, තායිවානය (ලකුණු 06)

(ආ) (i) පහත දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි ඔබේ පිළිතුරු පත්‍රයේ A, B, C, D පිළිවෙලින් ලියා දක්වන්න. (ලකුණු 04)

A පනාකඩුව තඹ සන්නස ලියන ලද පාලකයා

B උඩරට රාජධානියේ බලයට පත් නායක්කර් රාජවංශයේ පළමු පාලකයා

C විධායක ජනාධිපති ධූරය හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

D බොස්නියාවේ සරයේවෝ නගරයේදී ඝාතනය වූ ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරු

- **A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.**


(ii) 1. A පින්තූරයේ දැක්වෙන පිළිරුව කුමන රජතුමාගේ ද?

2. මෙම රජතුමා කළ මහා පූජාව කුමක් ද?

3. මෙම පිළිරුව දක්නට ඇති ස්ථානය කුමක් ද?

4. මෙම රජතුමා කළ පූජාවට පූජා ද්‍රව්‍ය ගෙන ආ රට කුමක් ද?

(ලකුණු 04)



A



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(iii) 1. B පින්තූරයෙන් දැක්වෙන නායකයා කවුද?

2. ඔහු නිර්මාණය කළ රට කුමක් ද?

3. එම රාජ්‍ය නිර්මාණය කිරීමේ කටයුත්තේ දී සතුරන් බවට පත් යුරෝපා රාජ්‍ය කුමක් ද?

4. පළමු ලෝක මහා සංග්‍රාමය ඇතිවීම සම්බන්ධයෙන් බලපෑ, මෙතුමා අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තිය කුමක් ද? (ලකුණු 04)



B

---

## II - කොටස

(02) (i) ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ දී තොරතුරු ලබාගත හැකි දකුණු ඉන්දියානු මූලාශ්‍ර 3 ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉතිහාසගත තොරතුරු හෙළිකරගත හැකි අභිලේඛන රචනා කර ඇති මාධ්‍ය 4 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ඉතිහාසය හැදෑරීම සඳහා සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනයේදී විචාර බුද්ධියෙන් කටයුතු කළ යුතු වන්නේ ඇයිදැයි කරුණු 2 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) නටඹුන් මගින් හෙළිකරගත හැකි ඓතිහාසික තොරතුරු 3 ක් නම් කර ඉතිහාසය හැදෑරීමේ දී නටඹුන් වැදගත් වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(03) (i) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පහත සඳහන් වාසස්ථාන අයත්වන පරිසර කලාප 3 නම් කරන්න.

A බුන්දල, පතිරාජවෙල

B සීගිරියේ පොතාන සහ අලිගල

C පාහියන්ගල, බටදොඹ ලෙන (ලකුණු 03)

(ii) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයාගේ ජීවන රටාවේ කැපී පෙනෙන අංග ලක්ෂණ 2 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසාන ක්‍රම දෙකක් නම් කර ඒවායේ ස්වභාවය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල දැකිය හැකි ලක්ෂණ තුනක් ඇසුරින් එම යුගයේ ජනාවාසවල ස්වභාවය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(04) (i) පහතින් සඳහන් වන්නේ බලය මධ්‍යගත වූ පසු ක්‍රියාත්මක වූ පාලන තන්ත්‍රයේ සිටි නිලධාරීන් ය. ඔවුන්ගේ කාර්යභාරයන් A, B, C අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A නගර ගුතික

B පන අදෙක

C බතගු (ලකුණු 03)

(ii) රජු ජනතාව ඉදිරියේ බලවත් පුද්ගලයෙකු ලෙස පෙනී සිටීමට භාවිතා කළ රාජ්‍යත්ව සංකල්ප 4 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විමධ්‍යගතව තිබූ අවධියේ පාලනය හා සම්බන්ධ වූ

(a) ගමික

(b) පරුමක යන නිළධාරින්ගේ කාර්ය භාරයන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍යය උරුමවීමේ සම්ප්‍රදායන් 3 ක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

(05) (i) අතීත වාරි ඉංජිනේරුවන් වැව් ඉදිකිරීමේ දී වැවේ ආරක්ෂාව සම්බන්ධයෙන් බොහෝ සැලකිල්ලක් දැක්වූ ආකාරය වැවට එක් කළ අංග වලින් පැහැදිලි වේ. පහත A B C වලින් සඳහන් වන්නේ එලෙස එක් කළ අංග කීපයකි. ඒවායින් ලැබෙන ප්‍රයෝජන A, B හා C අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A රළපනාව

B සොරොව්ව

C බිසෝකොටුව (ලකුණු 03)

(ii) පහත ප්‍රකාශවලට ගැලපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා A, B, C, D අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A වෙර බලයක් යෙදීමෙන් ගල්පතුරු ගලවා මෙවලම් තැනීම

B පානීය ජලයේ ප්‍රමිතිය ආරක්ෂා කිරීමට විශාල මැටි බඳුන් ළිඳ තුළට බස්සවා සකස් කළ ළිං

C රුවන්වැලි සෑය අකුණු සැරවලින් වැළැක්වීම සඳහා එක් කළ උපකරණය

D සමනොල වැව ප්‍රදේශයේ යකඩ නිස්සාරණ උඳුන් දැල්වීමට යොදාගත් දර වර්ගය ලබාගත් ශාකය (ලකුණු 04)

(ආඩියා ළිඳ, මරං, පීඩන ගල්කනය, උ෴රා කැට ළිඳ, වජ්‍ර චුම්බට, මොහොළ)

(iii) පුරාණ ශ්‍රී ලංකාවේ යකඩ නිස්සාරණය කළ බවට සාධක හමුවන ස්ථාන දෙකක් නම් කර ඒ ඇසුරෙන් ලංකාවේ යකඩ නිස්සාරණය කිරීමේ ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) ස්වභාවධර්මයට අයත් භෞතික තත්වයන් මැන ගැනීමට සමත්වන ක්‍රමවේදයක් අපේ අතීත සමාජය සතුවිය. ඔවුන් අතීතයේ මිනුම් ක්‍රම භාවිතා කළ ක්ෂේත්‍ර 3 ක් දක්වා භාවිතා කළ මිනුම් පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 06)

(06) (i) කෝට්ටේ vi වැනි පරාක්‍රමබාහු රජතුමාගේ අවධියේ සිදුවූ වැදගත් දේශපාලන සිදුවීම් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත A, B, C, D ප්‍රකාශවලට අදාළ පිළිතුරු පිළිවෙලින් ලියන්න.

A මුල්වරට උඩරට ස්වාධීන රාජ්‍යයක් ආරම්භ කළ පාලකයා

B ලංකාවේ අවසාන සිංහල රජතුමා

C කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ පියා

D ගම්වැසියෝ පරම්පරාගතව බුක්ති විඳි ඉඩම් (ලකුණු 04)

(iii) මහනුවර රාජධානියේ ප්‍රාදේශීය පාලනය හෙවත් රටවසම සංවිධානය වූ ප්‍රධාන පාලන ඒකක දෙක නම්කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මහනුවර රාජධානි අවධියේ ආර්ථිකයේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් ඇසුරෙන් එහි ආර්ථික කටයුතු පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 06)

(07) (i) පහත සඳහන් දේශපාලන ප්‍රතිසංස්කරණ හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය A, B, C අනුපිළිවෙලින් නම් කරන්න.

A ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම

B සීමිත ඡන්ද ක්‍රමය හඳුන්වා දීම

C විධායක කාරක සභා ක්‍රමය හඳුන්වාදීම (ලකුණු 03)

(ii) බ්‍රිතාන්‍ය පාලනය නිසා ලැබුන ප්‍රයෝජනවත් අංග 4 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විධායක ජනාධිපතිවරයා සතු

(a) ව්‍යවස්ථාදායකය සම්බන්ධ බලතල 3 ක් නම් කරන්න.

(b) විධායකයේ නායකයා ලෙස හිමි වූ බලතල 2 ක් නම් කරන්න. (ලකුණු 05)

(iv) රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේ දී හා නිදහස දිනාගැනීමෙන් පසුව වී ගොවිතැන දියුණු කිරීම සඳහා ආරම්භ කළ සංවර්ධන ව්‍යාපාර 2 ක් නම් කර එම ව්‍යාපාරවල අරමුණ පැහැදිලි කරන්න. (ලකුණු 06)

## III - කොටස

(08) (i) පහත ප්‍රකාශයන්ට අදාළ විප්ලවයන් A, B, C පිළිවෙලින් ලියන්න.

A නියෝජිතයන් නැතිනම් බදුත් නැත

B නිදහස සමානාත්මතාවය හා සහෝදරත්වය

C ඉඩම්, සාමය හා ආහාර (ලකුණු 03)

(ii) ඇමෙරිකාවේ ජනපද පිහිට වූ යුරෝපා රටවල් 4 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) යුරෝපීයන් ඇමෙරිකාවේ ජනපද පිහිටුවීමට බලපෑ හේතු 2 ක් නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) ප්‍රංශ විප්ලවයට බලපෑ දාර්ශනික මතවාද ඉදිරිපත් කළ දාර්ශනිකයන් තිදෙනෙකු නම් කර ඔවුන්ගේ මතවාද පැහැදිලි කරන්න. (ලකුණු 06)

(09) (i) පළමුවන ලෝක යුද්ධයට සම්බන්ධ වූ මධ්‍යම බලවතුන්ගේ රටවල් 3 ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පළමු ලෝක යුද්ධය අවසානයේ සාම ගිවිසුමක් ඇති කර ගැනීම සඳහා ප්‍රංශයේ පැරිස් නුවරට එකතු වූ නායකයන් හතරදෙනෙක් පහත දැක්වේ. ඔවුන් අයත් රටවල් 4 නම් කරන්න.

A වුඩ්රෝ විල්සන්

B ලොයිඩ් ජෝර්ජ්


C ක්ලෙමන් ෂෝ

D වික්ටෝරියෝ ඔලැන්ඩෝ (ලකුණු 04)

(iii) සීතල යුද්ධය හෙවත් නිරවි යුද්ධය යනු කුමක්දැයි හඳුන්වා එහිදී රාජ්‍යයන් අනුගමනය කළ උපක්‍රම තුනක් නම් කරන්න. (ලකුණු 05)

(iv) එක්සත් ජාතීන්ගේ සංවිධානය වර්තමාන ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග 3 ක් දක්වා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(01) (අ) (i) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා සිතියම



(01) (අ) (ii) ප්‍රශ්නයට අදාළ ලෝක සිතියම




## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(4) | 3 -(2) | 4 -(1) | 5 -(3) | 6 -(1) | 7 -(3) | 8 -(1) | 9 -(4) | 10 -(3) |
| 11-(2) | 12 -(3) | 13 -(3) | 14 -(4) | 15 -(2) | 16 -(3) | 17 -(1) | 18 -(3) | 19 -(3) | 20 -(4) |
| 21-(3) | 22 -(2) | 23 -(4) | 24 -(1) | 25 -(3) | 26 -(2) | 27 -(3) | 28 -(4) | 29 -(1) | 30 -(2) |
| 31-(1) | 32 -(4) | 33 -(3) | 34 -(1) | 35 -(2) | 36 -(3) | 37 -(1) | 38 -(3) | 39 -(3) | 40 -(2) |


(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (අ) (i)




(ii)



## I - කොටස

(01) (ආ) (i) A I විජයබාහු රජතුමා B ශ්‍රී විජය රාජසිංහ
C 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව D ප්‍රාන්ස් පර්ඩිනන්ට් (ලකුණු 04)

(ii) 1. භාතිකාභය රජතුමාගේ 2. රුවන්වැලි සෑ ගර්භය පබළු දැලකින් අලංකාර කිරීම (කඤ්චුක පූජාව)
3. රුවන්වැලි සෑ මළුවේ 4. රෝමයෙන් (ලකුණු 04)

(iii) 1. ඔටෝවොන් බිස්මාර්ක් 2. ජර්මනිය
3. ප්‍රංශය 4. ජර්මන් බස කතාකරන කුඩා රාජ්‍යයන් එකතු කිරීම (ලකුණු 04)

## II - කොටස

(02) (i) සීලප්පදිකාරම් / මනිමේකලෛයි / පදිර්රුපත්තු (ලකුණු 03)

(ii) මැටි පුවරු, බිත්ති, තඹ තහඩු, රන් තහඩු, දැව, විවිධ භාජන (මින් 4 ක් දැක්වීමට) (ලකුණු 04)

(iii) <u>මූලාශ්‍රය රචනා වූ කාලය</u>

මූලාශ්‍ර කෘති විවිධ කාල වකවානුවල රචනා වූ බව සඳහන් වේ. සමහර කෘති සිදුවීම් සිදුවී ශතවර්ෂ ගණනාවකට පසු රචනා වූ ඒවාය. එවිට එම සිදුවීම්වල සත්‍ය අසත්‍ය තාවය පිළිබඳ විචාරාත්මකව බැලිය යුතුය.

<u>මූලාශ්‍රයේ කතුවරයා</u>

මූලාශ්‍ර රචනාවීමට කතුවරයාගේ අරමුණ බලපානු ලැබේ. උදාහරණ ලෙස අනුරාධපුර යුගයේ සිට කෝට්ටේ යුගය තෙක් ලියවුන කෘති ආගමික අරමුණකින් ලියවුන ඒවා වේ. විවිධ යුගවල කෘති රචනාවීමට කතුවරයාගේ අරමුණු බැව් තිබේ. එවැනි අවස්ථාවකදී අපට අවශ්‍ය කරන තොරතුරු සොයාගැනීමට විචාර බුද්ධියකින් යුතුව පරිශීලනය කළ යුතු වේ. (ලකුණු 05)

(iv) <u>මූලාශ්‍රයට කරුණු සපයාගත් ආකාරය</u>

* අතීත නටඹුන් මගින් පැරණි මිනිසාගේ තාක්ෂණය පිළිබඳ තොරතුරු අනාවරණය කරගත හැක. උදාහරණ - රුවන්වැලි සෑය ඉදිකිරීමට පදනම සකස් කිරීම නූතන කොන්ක්‍රීට් තාක්ෂණයට සමාන ක්‍රමවේදයක් අනුගමනය කර ඇති ආකාරය පැහැදිලිවේ. එමෙන්ම අකුණු සැර නොවදින ලෙසට නිර්මාණය කළ වජ්‍රචුම්බට උපකරණ වර්තමානයෙත් අදාළ කරගත් තාක්ෂණ ක්‍රමයකි.
* පරිසර සංරක්ෂණය
  මේ සඳහා අතීත ශිල්පියා යෙදූ උපක්‍රම ඉතාම පැහැදිලිය. වැසිකිළි කැසිකිළි පද්ධතිවල අපද්‍රව්‍ය ඉවතට යාම සඳහා යෙදූ උපක්‍රමයත් විස්මයජනකය
* ජල පාලනය කිරීම
  මේ සඳහා අතීත ශිල්පියා යෙදූ ක්‍රම ශිල්ප ඉතාම වටින්නේ ය. ප්‍රධාන වැවෙන් පෝෂණය වන වැව් පද්ධතියේ නටඹුන් අදටත් වියළි කලාපයේ පවතී. එල්ලංගාව වැව් ප්‍රපතනය ලෙස වියළි කලාපයේ ජනතාව දක්වා ඇත. (ලකුණු 06)

(03) (i) A අර්ධ ශුෂ්ක කලාපය, පහතරට අර්ධ ශුෂ්ක කලාපය B පහතරට වියළි කලාපය
C තෙත් කලාපය, පහතරට තෙත් කලාපය (ලකුණු 03)

(ii) * ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා වර්ෂයේ වැඩි කාලයක් සංචාරකව ජීවත් වීම, සතුන් දඩයම් කරමින් ස්වභාව ද්‍රව්‍ය එකතුකරමින්
* කුඩා කණ්ඩායම් ලෙස සංවිධානය වී ජීවත් වීම (ලකුණු 04)

(iii) * ඉබ්බන්කටුව මහා ශිලා සුසානය
* යාපහුවේ ගල් සොහොන් කනත්ත
* ගලේවල අඳුරු යටිගල්පොත්ත සුසානය
  විශාල ගල් පතුරු එක්තැන් කර චතුරශ්‍රාකාර ලෙස සකසන ගල් පුවරුවකින් වසා ඇත. ඒ තුළ භෂ්මාවශේෂ සහිත මැටි භාජන තැන්පත් කිරීම (ලකුණු 05)

(iv) මුල් ඓතිහාසික යුගයේ වියළි දේශගුණයක් සහිත ප්‍රදේශවල වාපි ගම්මාන නිර්මාණය විය. වැසි ජලයෙන් පෝෂනය වන කුඩා වැව් කේන්ද්‍ර කර ගනිමින් එකිනෙකට ස්වාධීන ජනාවාස බිහි විය. සුමනවාපිගාම විහාරවාපි ගාම ආදී ලෙස මහා වංසයේ සඳහන් වන්නේ මෙම ගම්ය. එමෙන්ම ගංගාවල පිටාර නිම්නයට ඇතින් ජනාවාස බිහිවීම මේ යුගයේ ලක්ෂණයකි.
එමෙන්ම විවිධ වෘත්තීන් පදනම් කරගෙන ජනාවාස බිහිවීමට මේ යුගයේ ලක්ෂණයකි. නිදසුන් ලෙස ධීවර ගම්, වළං තනන්නන්ගේ ගම්, වරාය ආශ්‍රිත ගම්, ගොපල්ලන්ගේ ගම් ආදී ලෙස දැක්වීමට පුළුවන. (ලකුණු 06)

(04) (i) A නගර පරිපාලක B වෙළඳ කටයුතු භාර ප්‍රධානී
C භෝජන ශාලා අධිකාරී (ලකුණු 03)

(ii) දේවත්ව / බෝධිසත්ව / පර්වතරාජ / චක්‍රවර්තී (ලකුණු 04)

(iii) ගමික
* ගම් ප්‍රධානීන් ලෙස කටයුතු කිරීම　　* ගෘහපතියන් අතරින් තෝරාගැනීම
* පොදු කටයුතුවලදි නායකත්වය දීම　　* ගමෙහි බදු එකතු කිරීම, ගමේ අරවුල් විසඳීම
* ගම් අතර සිදුවන විවාහ කටයුතු, භාණ්ඩ හුවමාරු කටයුතුවලදී සහය දීම

පරුමක
* ගමිකයන් අතරින් වඩාත් බලවත් තැනැත්තා පරුමක වීම
* වැව් පද්ධතියට අයත් සියලු නඩත්තු කටයුතු භාරවීම (ලකුණු 05)

(iv) පියාගෙන් පුතාට
මෙම ක්‍රමයට රාජ්‍ය ලැබීම සුලභ ක්‍රමයකි. පියාගෙන් පුතාට ක්‍රමයට රාජ්‍ය ලැබුන එක් අවස්ථාවක් නම් කාවන්තිස්ස රජුගෙන් පසු දුටුගැමුණුට රාජ්‍ය හිමිවීමයි. එමෙන්ම වසභ රජුගෙන් පසු ඔහු පුත් වංකනාසිකතිස්ස රජුට රජකම හිමිවිය.

මව් උරුමය
රජුගේ සහෝදරියගේ පුතාට
රජුගේ දියණියගේ පුතාට

සහෝදරයාගෙන් සහෝදරයාට උරුමවීම ඊළඟ ක්‍රමයයි.
දේවානම් පියතිස්සගෙන් පසු ඔහුගේ සොයුරන්ට රජකම හිමිවීම
දුටුගැමුණුගෙන් පසු සද්ධාතිස්සට රජකම උරුමවීමේ ක්‍රමය ද ඇත.

බිසවගේ සොයුරාට රජකම හිමිවීම තව ක්‍රමයකි
උඩරට රාජධානියේ නායක්කාර් වංශික රජකම උරුම වූයේ මේ ක්‍රමයට ය. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ පසු ඔහු විවාහ කරගත් නායක්කාර් කුමරුගේ සොයුරා වන ශ්‍රී විජය රාජසිංහට බලය ලැබුනි. (ලකුණු 06)

(05) (i) A සුළඟ සමග මිශ්‍රවන ජලයේ චලිතය නිසා සිදුවන වැව් බැම්ම බාදනය වීම වළක්වා ගැනීමට හැකිවීම
B වැව තුළින් පිටතට ජලය මුදාහැරීමට
C අවම පීඩන තත්වයක් යටතේ ජලය පිටතට ගැනීමට (ලකුණු 03)

(ii) A පීඩනශල්කනය B ඌරාකැට ළිං C වජ්‍ර චුම්බට D යකඩ මරට (ලකුණු 04)

(iii) සබරගමු පළාතට අයත් බලංගොඩ සමනොල වැව ප්‍රදේශයෙන් සොයාගත් යකඩ උදුන් මෙම උදුන් ස්වභාවික සුළං බලයෙන් ඇවිලීමට අවස්ථාව සලසා ඇත. එහිදී ගිනි ඇවිලීම සඳහා යඩකමං ගස් හා ලිමොනයිට හෙමටයිට් යන ගල් වර්ග භාවිතා කර ඇත.
දෙවෙනි අවස්ථා - සීගිරිය ප්‍රදේශයේ දෙහිගහ ඇළ කන්ද ප්‍රදේශයයි. එහි යකඩ ගිනියම් කිරීමට මයිනහමක ආධාරය ලබාගෙන ඇත. (ලකුණු 05)

(iv) අවකාශය පිළිබඳ මිනුම් / දුර මැනීම පිළිබඳ මිනුම් / බර මැනීම පිළිබඳ මිනුම්
අවකාශ මැනීම
* ගොවිතැන් සඳහා ඉඩම් භාවිතයේදී මෙම මිනුම් ක්‍රම භාවිතා විය.
* ගොවිතැන ආශ්‍රයෙන් ඒ සඳහා මිනුම් ක්‍රම සකස් කර ගන්නා ලදී.
* කිරිය අමුණ කරිසය ඒ සඳහා භාවිතා වු මිනුම්මය.

දුර මැනීම පිළිබඳ මිනුම්
දිග දුර හා කෙටි දුර මැනීම සඳහා මිනුම් භාවිතා විය. කෙටි දුර මැනීමට ආංශුලය වියත යන මිම් භාවිතා විය. ගොඩනැගිලි ඉදිකිරීමේදී හා පිළිම නිර්මාණයේ දී මෙම මිම් භාවිතා විය. දිග දුර මැනීමට ගව්ව, යොදුන, උස යන මිම් භාවිතා විය. මාර්ගවල දිග මැනිමට මෙම මිම් භාවිතා කරන ලදී. නිශ්ශංකමල්ල රජතුමා මෙම ගාවුක කණු ගව්වෙන් ගව්වට සිටුවා ඇත.

බර මැනීම
වෙළඳ කටයුතුවලදී වෙළඳ භාණ්ඩවල බර නිවැරදිව මැනගැනීමට අවශ්‍ය විය. වීහ, ගුන්ජා, මාසක ආදි මිනුම් භාවිතා කරන ලදී. (ලකුණු 06)

(06) (i) * ජෝතිය සිටානන්ගේ කැරල්ල
*
* යාපනය / වන්නි ප්‍රදේශ / උඩරට ප්‍රදේශය (ලකුණු 03)

(ii) A සේනාසම්මත වික්‍රමබාහු　　B ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා
C නරේනප්පා නායක්කර්　　D පරවේනිගම (නින්දගම්) (ලකුණු 04)

(iii) උඩරට රාජ්‍ය රට හා දිසා ලෙස ප්‍රධාන ප්‍රාදේශීය පාලන ඒකක දෙකක් තිබීම දිසාවන් 12 ක් දක්නට ලැබුනි. දිසාවන් භාරව දිසාවේවරු පාලනය කළ ඇති අතර රට යන ප්‍රදේශ භාරව රටේ මහත්වරු කටයුතු කළහ. දිසාවන් කෝරළ පත්තු ආදී උප කොටස්වලට නැවත බෙදන ලදී. (ලකුණු 05)

(iv) කෘෂිකර්මාන්තය
කඳුකර බැවුම් ඔස්සේ හෙල්වල ගොවිතැන් කටයුතු සිදුකිරීම කුරක්කන්, අමු මෙනේරි ආදී ධාන්‍ය වර්ග වගා කරන ලදී. ගෙවතුවල කොස්, දෙල්, ගම්මිරිස් ආදිය වගාකරන ලදී. අතිරේක ආහාර බෝගද වවන ලදී.

කර්මාන්ත
යකඩ, දුව, ලෝහ හා ලාක්ෂා කර්මාන්ත ද, පන් කර්මාන්තය ද මේ යුගයේ පැවතුනි. (ලකුණු 05)

(07) (i) A 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ
B 1924 කෲව් මැකලම්
C 1931 ඩොනමෝර් (ලකුණු 03)

(ii) බ්‍රිතාන්‍ය පාලනය නිසා උරුම වූ ප්‍රයෝජනවත් අංග
* ජාත්‍යන්තර භාෂාවක් වූ ඉංග්‍රීසි දැනුම ලැබීම
* අපනයන වැවිලි බෝග හඳුන්වාදීම
* පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ලැබීම
* ගමනාගමන පද්ධතිය දියුණු කිරීම

(iii) (a)
* පාර්ලිමේන්තුව කැඳවීම
* මුලසුන දැරීම
* පාර්ලිමේන්තුව විසුරුවා හැරීම
* වාරාවසාන කිරීම
* ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීම

(b)
* අගමැතිවරයා පත්කිරීම
* ඇමතිවරුන් පත්කිරීම
* ඇමතිවරුන්ට විෂය හා කාර්යයන් පැවරීම

(iv) ගොවිජනපද ව්‍යාපාරය / මහවැලි සංවර්ධන ව්‍යාපාරය
ගොවිජනපද ව්‍යාපාරය
මෙමගින් තෙත් කලාපයේ ඉහළ යන ජනගහන තදබදයට පිළියම් යෙදීම, ආහාර නිෂ්පාදනය වැඩි කිරීම, වියළි කලාපයේ පැරණි වැව් හා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය, තෙත් කලාපයේ ඉඩම් හිඟයට පිළියම් යෙදීම
මහවැලි ව්‍යාපාරයේ අරමුණු
වියළි කලාපීය ගොවියන්ට ජලය ලබාදීම, විදුලිබල ඉල්ලුම සපුරාලීම, නව ජනාවාස බිහිකිරීම

## III - කොටස

(08) (i) A ඇමෙරිකානු නිදහස් සටන
B ප්‍රංශ විප්ලවය
C රුසියන් විප්ලවය (ලකුණු 03)

(ii) පෘතුගාලය, ස්පාඤ්ඤය, ඕලන්දය, ප්‍රංශය, බ්‍රිතාන්‍ය (හතරක් දැක්වීමට ලකුණු 04)

(iii) ආගමික ගැටුම්
යුරෝපා රටවල පැවති රෝමානු කතෝලික හා රෙපරමාදු ආගමික ගැටුම් නිසා ආගමික නිදහස පතා නව ප්‍රදේශ වෙත යුරෝපීය ජනතාව ඇදීයාම
නව ප්‍රදේශ අත්පත් කර ගැනීම
සම්පත් බහුල ප්‍රදේශ අත්පත් කරගෙන ජන ජීවිතය සෞභාග්‍යමත් කර ගැනීම
යුරෝපා පාලකයින් ලබාදුන් ධෛර්ය හා උනන්දුව
නව ප්‍රදේශ යටත් කරගෙන කීර්තිය හා ධනය වර්ධනය කරගැනීම, එදා පාලකයන් අනුග්‍රහ දැක්වීම (ලකුණු 05)

(iv) මොන්ටෙස්ක්‍යු / වෝල්ටෙයාර් / රූසෝ (ඔවුන්ගේ දර්ශනයන් ලියා තිබිය යුතුයි. (123 පිටුව) (ලකුණු 06)

(09) (i) ජර්මනිය, ඔස්ට්‍රියාව, තුර්කිය, බල්ගේරියාව, හංගේරියාව (කරුණු 3 ක් දැක්වීමට ලකුණු 03)

(ii) A ඇ. එ. ජනපද ජනාධිපති B බ්‍රිතාන්‍ය අගමැති
C ප්‍රංශ අගමැති D ඉතාලියේ අගමැති (ලකුණු 04)

(iii) දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝකය බල කඳවුරු දෙකට නොබෙදී අවි ආයුධ භාවිතා නොකර තම කඳවුර ජයග්‍රාහීකර ගැනීම සඳහා විවිධ උපක්‍රම කරමින් ගෙන ගිය සටන සීතල යුද්ධය ලෙස හඳුන්වයි. දෙවන ලෝක යුද්ධයෙන් පසු දශක 4 ක් මෙය පැවතුනි.
මේ අය යෙදූ උපක්‍රම රහස් ඔත්තු සේවා යොදාගැනීම / සංවිධාන පිහිටුවීම / ආධාර වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීම

(iv)
* ආර්ථික සම්බාධක පැනවීම
* න්‍යෂ්ටික අවි තැනීම සීමා කිරීම හා පාලනය සඳහා කටයුතු කිරීම / සාම සාධක හමුදාව යෙදවීම
* විස්තර කිරීම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තීරණවලට එරෙහිව කටයුතු කරන රටවලට ආර්ථික සම්බාධක පැනවීම. ඒ තුළින් එකිනෙක ක්‍රියාත්මක කිරීමට රටවල් පොළඹවා ගැනීම
* ඇතැම් රටවල් අලුතින් න්‍යෂ්ටික අවි තනන බව සැලවුන විට එක්සත් ජාතීන්ගේ කොමිෂන් සභා මගින් ඒවා පරීක්ෂා කිරීම. උතුරු කොරියාව සහ ඉරානය න්‍යෂ්ටික අවි පිරික්සීමට කොමිෂන් සභා පත්කිරීම
* දෙපාර්ශවය අතර දරුණු ගැටුම් ඇති වූ විට ඒවා පාලනයට එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා යෙදවීම